# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13
### 2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි
### (නව / පැරණි නිර්දේශය)

### සමාජීය විද්‍යා පීඨය

### දේශපාලන විද්‍යාව - POLS - E 1015

### දේශපාලන න්‍යාය හා ක්‍රියාවලීන්

**ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. "නූතන යුගය දේශපාලන යුගයයි සෑම තැනම දේශපාලනය පවතී" මෙම ප්‍රකාශය විස්තර කරන්න.

02. **එක්කෝ**
දේශපාලනය අධ්‍යයනය සඳහා යොදා ගන්නා විවිධ ප්‍රවේශ මොනවාද? ඒවායෙහි ශක්‍යතා සහ සීමා කෙටියෙන් සාකච්ඡා කරන්න.

**නැතහොත්**
දේශපාලන විද්‍යාව පැහැදිලි උපවිෂය විෂය ක්ෂේත්‍ර ගණනාවකට බෙදී තිබේ. ඒවා විස්තර කරන්න.

03. රාජ්‍යයේ ආරම්භය පිළිබඳ දේවවරම්වාදී න්‍යාය විවේචනාත්මකව විමර්ශනය කරන්න.

04. බලතල බෙදීමේ න්‍යාය ඉදිරිපත් කිරීමට පසුබිම් වූ කරුණු සඳහන් කරමින් මොන්ටෙස්ක්‍යුගේ අදහස්වල තර්කානුකූලභාවය විමසන්න.

05. නූතන ජාතික රාජ්‍යයේ ඓතිහාසික වර්ධනය පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න.

06. රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය විවේචනාත්මකව විමර්ශනය කරන්න.

07. "ස්ත්‍රීවාදය පොදු අරමුණු පදනම් කරගත් විවිධ මතවාදයන් හි සහ සමාජ ව්‍යාපාරයන් හි එකතුවකි." සාකච්ඡා කරන්න.

08. ප්‍රවර්තනීය සංවර්ධනය යනු කුමක්ද? ප්‍රවර්තනීය සංවර්ධනයේ අරමුණු විස්තර කරන්න.

09. නව යටත්විජිතවාදය අර්ථ දක්වා සංවර්ධනය වෙමින් පවතින රටවලට එමගින් ඇතිවන බලපෑම සඳහන් කරන්න.

*********************************